## 293 සගේ දෙව්ඳුනට

සගේ දෙව්ඳුනට මහිමය වේවා
මෙලෝ සුසිතුනට සාමය වේවා.

දෙව් සමිඳුනි සුර රජාණනි
සියලු බලැති දෙව් පියාණනි

අපි ඔබ පසසමු ඔබ ගුණ වනමු
නමදිමු මහිමය පළකරමු

ඔබ සතු මහා මහිමේ නිසා
ඔබ හට නිති තුති පුද කරමු

ඒක ජනිත පුත් ජේසු සමිඳුනේ
දේව බැටළු පොව්වාණනේ

ලෝ පව් දුරලන කිතු සමිඳේ
පිළිගනු මැන මේ යැඳුම අපේ

වැඩ වසනා ඔබ පිය දකුණේ
අප හට කරුණා කරනු මැනේ

සුදනුන් සමගින් දෙව් පිය මහිමේ
නිති වැඩ වසනා ජේසු සුරිඳුනේ

ඔබ පමණය පිරිසුදු වනුවෝ
ඔබ පමණය සමිඳෝ
ඔබ පමණය අති උතුමෝ. ආමෙන්.